අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களை புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு
COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07. த.பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 07. P.O. Box 1431, 36, Malalasekara Mawatha, Colombo 07.
දුරකථන අංක/தொலைபேசி/Telephone: +94 112596365, +94 112596360 ක්ෂණික ඇමතුම් අංකය/Hotline: 1954 ෆැක්ස්/மின்னஞ்சல்/Fax: +94 112595045
වෙබ් අඩවිය/இணையத்தளம்/website: www.ciaboc.gov.lk විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/E-mail : ciaboc_gen@ciaboc.gov.lk

මාධ්‍ය නිවේදන අංක 2025/101/R

2025.09.15

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>ගාල්ල, නිවාස සංවර්ධන අධිකාරී කාර්යාලයේ නිවාස (තාක්ෂණික) නිලධාරියෙකු අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

පිටිගල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු විසින් සිදුකරන ලද පැමිණිල්ලක් අනුව පැමිණිලිකරුගේ නිවස ඉදිකිරීම සඳහා නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලබාදෙන රු. ලක්ෂ 10 ක ආධාර මුදල ලබාදීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය හා නිර්දේශය ලබාදීමට රු. 50,000/- ක මුදලක් අල්ලස් ලෙස ඉල්ලා, 2025.08.19 දින මෙම ආධාර මුදලේ පළමු වාරිකය ලෙස රු. 146,000/- ක මුදල පැමිණිලිකරු ලබාගන්නා අවස්ථාවේදී ඉන් රු. 25,000/- ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබාගෙන ඇති අතර, ඉතිරි ආධාර මුදල ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරදීමට හා නිර්දේශය ලබා දීම වෙනුවෙන් රු. 25,000/- ක මුදලක් ඉල්ලා ලබාගැනීමේ දී ගාල්ල, නිවාස සංවර්ධන අධිකාරී කාර්යාලයේ නිවාස (තාක්ෂණික) නිලධාරියෙකු 2025.09.15 වන දින පෙ.ව. 11.45 ට පමණ නියාගම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන අංශය තුළදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත් අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගත් සැකකරු බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මාධ්‍ය ඒකකය
0112502672